# ශ්‍රමදාන උදානය

**කිත්සිරි බ. බුලත්ගම**
කෘෂිකර්ම උපදේශක—නිල්දණ්ඩාහින්න.

පියා සහ මව වෙලට බැස වැඩ කරන විට ගත වෙහෙස කර වා
පුතා සහ දුව පුටුව පිට හිඳ සිටිය දෙකකුල් සොලව සොල වා
ඉතාමත් දූය දිලිඳු විය ඉන් තුව තවත් එය දුබල වෙන වා
ගසා දමමින් එවැනි පුහු මත මෙන්න දරුවොත් වෙලට එන වා

පුතුන් කුඹුරට බසිනු දුටු පිය වරුන් සිත් එඩි බවට පත් වේ
දූන් කුඹුරේ දුටුව මවගේ නුවන් තුටු නෙත් දියෙන් තෙත් වේ
තමන් ගුරු මණ්ඩලද කුඹුරේ මඩට බැස දරුවනට එක් වේ
එයින් තම වැඩ සමහ දෙස දූය දියුණු පතමින් ගොවින් මත් වේ

පලාතේ ගොවි නිලදරුන් සැම කෙතට බැස වැඩ මෙහෙය වන වා
ගමේ ගම් සේවකද පබුදනා එක් වෙමින් නිසි සහය දෙන වා
කුඹුරු හිමියන් ගොවින් මෙය දැක මහා ඉහලින් සතුටු වෙන වා
මෙද මෙම සේවයෙන් කුස ගිනි නමැති සතුරා පරද වන වා

දූයේ සමයේ දියුණු සැලැසුව අපගෙ ඉතිහාසයෙහි දික් වූ
අපේ මහ සඟ රුවන බොහො තැන් වලදී මෙම සේවයට එක් වූ
බසින් හර-බර ඔවා දීමෙන් කසුන් අගනා සහය දක් වූ
මෙයින් සැලැසී නැගේවා අප දූයේ දියුණුව අසිරි මත් වූ

ලොවේ සැම සත්වයෙකු හට මේ අහර පැනයයි මුලට එන් නේ
නැවේ ගෙන එන සහල් කවද කොතැනකදී හෝ නතර වන් නේ
වමේ දකුණේ වගක් කුමටද කාහටත් කුස ගිනි නැගෙන් නේ
දූයේ පොදු දියුණුවය ගොවිතැන, කවුද ඒ බව නැහැ කියන් නේ

අදරබර පුත්වරුනි පිය දූවරුනි අප ගත වෙහෙස වා ලා
නිතර බැතියෙන් යුතුව අපගේ සිරුරු බල දනයට දී ලා
කවර ගැහැටක් වුවද විඳගෙන දූයේ දියුණුව සලසවා ලා
පවර ලක් මව ගෙලෙහි පලදමු, අහර සටනේ විජය මා ලා

වැඩෙන පැලපත ගොයම ගෙම්හිට තවානට බැස ගලව ගල වා
තිබෙන මුල්වල සෝදමින් මඩ දියෙහි මතුපිට සොලව සොල වා
අඩිය තබමින් මඩෙහි තාලෙට ලමා බඳ ලැම ලෙලව ලෙල වා
ගොයම් පැල සිටුවනා දරුවන් බලව් ! ගොවි සිතු නලව නල වා

ගොයම් පැල සිටුවීම වල් ගැලවීම කුඹුරෙහි දුරැර මා නෝ
බැතින් සැම දෙන කලොත් එකතුව පුද දෙමින් තම ශ්‍රමය ද නෝ
නිතින් දුක් දෙන ක්ෂුධා ගිණි යකු හොවා සදහට නිදන යා නෝ
තුටින් සිටියැක හුවා තබමින් නැවත හෙල දැ ආබි මා නෝ

වැස්ස පින්නද හිරුගෙ සැඩ රැස මඩද තද සීතලැති වතුර යි
මෙවැනි වැඩවල යෙදෙන අප හට එරෙහි වී නැග සිටින පිරිස යි
අපද සිත එඩිතරව නොමැලිව අපේ සේවය කලොත් නියත යි
එරෙහි වී එන සියළු බාදක, නිවට වී අප හමුවෙ පරදි යි

දූයෙහි මතු වග කීම දරුමට කැපව ඇති මේ මහඟු දරු කැල
සිහිති සුරතල් ඇඟිලි තුඩුවල පහස ලැබ දුන් මේ ගොයම් පැල
සිතැඟි ලෙස සරු සාර විලසින් වැඩී, පුරවා සැමගෙ මන දෙල
අනගි රන්වන් කරල් පැසෙමින් එකට සියයක් ලැබෙවා පල


## ගොවිකම් සඟරාව

ගොවිකම් සඟරාව අවුරුද්දකට හතර වරක් මාර්තු, ජූනි, සැප්තැම්බර්, දෙසැම්බර් යන කාල සීමාවන්හි මුද්‍රණාලයෙන් පිටවේ. කලාප හතරටම අවුරුද්දක දයක මුදල රුපියලකි. ඔබේ මුදල් ඇනවුම් කෘෂිකර්ම නිලධාරී (ව්‍යාප්ති ආධාර), තැ. පෙ. 636, කොළඹ 1, යන ලිපිනයට එවන්න.